# ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා පුස්තකාල ඉතිහාසය

කේ. ඒ. එස්. ආර්. කුලසිංහ[1]

**සංක්ෂේපය**

ඕනෑම රටක ඉදිරි අනාගත සංවර්ධනයේ පිළිබිඹුව ලෙස අධ්‍යාපනය දැක්විය හැක. රටක ආර්ථික, දේශපාලනික, සමාජීය, සංස්කෘතික යන කුමන අංශයක් යටතේ වුව ද ඉදිරි යහපැවැත්ම උදෙසා අධ්‍යාපනයෙහි දායකත්වය ප්‍රමුඛ ලෙස සැලකිය හැකිය. මෙලෙස රටක සෑම අංශයකටම දායකත්වය සපයන අධ්‍යාපන ක්ෂෙත්‍රයේ ආරම්භය පිළිබඳවත් ඊට දායකත්වය සපයන පුස්තකාල ක්ෂෙත්‍රයේ ඉතිහාසය පිළිබඳවත් අධ්‍යයනය කිරීම වැදගත් වේ. මෙම අධ්‍යයනයේ අරමුණු ලෙස ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය පිළිබඳවත් ලෝකයේ සහ ශ්‍රී ලංකාවේ පුස්තකාල ආරම්භය පිළිබඳවත් අධ්‍යයනය කිරීම යොදා ගෙන ඇත. මෙම අධ්‍යයනය ද්විතික දත්ත ආශ්‍රයෙන් සිදු කොට ඇති අතර ද්විතික දත්ත මූලාශ්‍ර ලෙස පොත් පත් හා සඟරා යොදා ගන්නා ලදී. එමෙන්ම දත්ත විශ්ලේෂණ කිරීම සඳහා විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගෙන ඇත. ඒ අනුව අධ්‍යාපන ක්ෂෙත්‍රය හා සම්බන්ධ පුස්තකාල සේවය අතීතයේදී නොදියුණු තත්වයක සිට ආරම්භ වී ඇති බවත් ඒ සඳහා විවිධ කාලවකවානුවල පැවති සමාජීය තත්වය මෙන්ම විවිධ අනුග්‍රහයන්ගේ බලපෑම හේතු වී ඇති බවත් සොයා ගන්නා ලදී. එමෙන්ම වර්තමානය වන විට ඉතා ක්‍රමවත් සහ සංවිධානාත්මකව ක්‍රියාත්මක වන පද්ධතියක් ලෙස පුස්තකාල සේවාව දැක්විය හැකිය. මේ අනුව නිගමනය කළ හැක්කේ අධ්‍යාපන පද්ධතිය තුළ ලේඛන කලාවේ දී වැදගත් අංශයක් ලෙස සැලකෙන පුස්තකාල සේවාව දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන බවයි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ පුස්තකාල භාවිතය ඈත අතීතයේ සිටම විවිධාකාරයෙන් ක්‍රියාත්මකව පැවති අතර අධ්‍යාපන ක්‍රමය ආරම්භයේ දී නොදියුණු ක්‍රමශිල්ප අනුගමය කළ ද වර්තමානය වන විට තාක්ෂණික ක්‍රමෝපායන් පුස්තකාල භාවිතයේ දී යොදා ගෙන ඇති බවයි.

**මුඛ්‍ය පද:** *අධ්‍යාපනය, පුස්තකාල, ඉතිහාසය*

[1] සමාජ සංඛ්‍යානය (විශේෂවේදී) තෙවන වසර, sithara.kulasinghe@yahoo.com

## හැදින්වීම

''දැනුම'' යන්න ඕනෑම පුද්ගල සමාජයක් තුළ ඉතා වැදගත් අංගයකි. මිනිසා වනචාරී ගති පැවතුම්වලින් මිදී ශිෂ්ටසම්පන්න සමාජයකට යොමු වීමත් සමඟ දැනුම සොයා යන්නට ආරම්භ විය. ලක්දිව වංශකතා තුළ ආර්ය ජනාවාස බිහිවීමට පෙර මෙරට විසූ ගෝත්‍රික ජනතාව තුළ සාක්ෂරතාව පැවති බවට සාධක නොතිබුණ ද මහින්දාගමනයෙන් පසුකාලීනව බ්‍රාහමණ සෙල්ලිපි දැකිය හැකි වීම නිසා එම කාලයේ සිට ලේඛනය අධ්‍යාපනය තුළ දැකිය හැකි විය.

පුස්තකාලය යන්නෙහි සරල අදහස පොත් රැස් කර තබන ස්ථානය ලෙස සැලකේ. පරිහරණය, භාවිතයට ගැනීම සඳහා පොත්පත් සංවිධානය කර ඇති ස්ථානය පුස්තකාලයයි. පරිහරණය කිරීමට පොත්පත් ඒකරාශී කර තිබෙන ස්ථානය පුස්තකාලයයි (උපමාලිකා, 2009). විශ්වීය දැනුම ලබා දෙන කේන්ද්‍රීය ස්ථානය ලෙස සැලකෙන විශ්වවිද්‍යාල ඕනෑම රටක ජාතික අධ්‍යාපනයේ වැදගත් අංශයකි. විශ්වවිද්‍යාලයන්හි මූලික අරමුණ වූයේ පූජ්‍යපක්ෂය දැනුවත් කිරීම වුව ද පසුකාලීනව පුරවැසියන් දැනුවත් කිරීම හරහා අවසාන වශයෙන් එය උසස් පර්යේෂණ තුළින් විශාල සමාජයක් දැනුවත් කිරීමක් දක්වා වර්ධනය විය.

ලොව සෑම විශ්වවිද්‍යාලයකම ප්‍රධාන පරමාර්ථය වන සත්‍ය ගවේෂණය සඳහා අවශ්‍ය සම්පත් සපයාදීම විශ්වවිද්‍යාල පුස්තකාලයන්හි මූලික වගකීම වේ. විශ්වවිද්‍යාල පුස්තකාලය යන්න විශ්වවිද්‍යාලයක හදවත සේ සැලකේ (Kanu & Arora, 2008). ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල ඉතිහාසය විමසීමේ දී 1870 දී වෛද්‍ය විද්‍යාල ඇති කිරීමෙන් පිහිටුවන ලද ඊට අනුබද්ධ පුස්තකාලය ශ්‍රී ලංකාවේ ප්‍රථම විශ්වවිද්‍යාල පුස්තකාලයයි (උපමාලිකා, 2009). පසුකාලීනව සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම් කටයුතු ආරම්භවීමත් සමඟ විශ්වවිද්‍යාල පුස්තකාල සතු භෞතික සම්පත් මෙන්ම සාමාජික සංඛාව ද වර්ධනය වෙමින් අද වන විට ඉතා දියුණු තත්වයක පවතී.

## ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය

''අධ්‍යාපනය'' හෙවත් ''ඉගෙනීම'' පැරණි ලාංකික සමාජය තුල ඉතා උසස් ලෙස අගය කෙරිණි. පන්සලේ වැලිපිල්ලේ අකුරු කරමින් අධ්‍යාපනය කෙරුණු ගැමි සමාජය තුළ පසුකාලිමව පුස්කොලපොත්හි ලිවීම ප්‍රගුණ විය. මෙම කාලයේ දී වනපොත් කිරීම හෙවත් කටපාඩම් කිරීම ඉගෙනීමෙහි ප්‍රධාන ක්‍රමවේදය වූ අතර මුල්කාලිනන ආගමික සිද්ධස්ථාන හරහා ගැමි ජනතාව සඳහා අධ්‍යාපනය ලබා දීම සිදු විය. විශේෂයෙන් පන්සල් ආශ්‍රිතව පිරිවෙන් අධ්‍යාපනය පවතී අතර හින්දු හා මුස්ලිම් ආගමිකයන් අතර ද අධ්‍යාපනික සම්ප්‍රදායන් පැවතිණි. කාරියවසම්, යූ. ජී. පී. සහ කාරියවසම් සුන්දරී

අධ්‍යාපනය දර්ශනය සමඟ බැඳී පවතින මනුෂ්‍ය ස්වාභාවයේ වටිනාකම් ග්‍රහණය කළ හැකි විෂය ක්ෂෙත්‍රයකි. විඥාන අධ්‍යාපනයෙන් කෙරෙන ඉතා උත්කෘෂ්ට කාර්යය වනුයේ ළමයාගේ පෞරුෂත්වය කිරීමත් උපරිම තත්වයට ආත්ම සාක්ෂාත්කරණය ඇති කිරීමයි (කාරියවසම් සහ කාරියවසම්, 1964, පිටු: 5). පුද්ගලයා

සමාජයෙන් අත්දැකීම් හා වින්දනයන් ජීවිත කාලය පුරාවටම ගනී. අධ්‍යාපනය සම්බන්ධයෙන් අධ්‍යාපනඥයින් විවිධ අදහස් දක්වා ඇති අතර ජෝන් ඇඩම්ස් අධ්‍යාපනය නම් කුමක් දැයි මෙසේ දක්වයි.

I. අධ්‍යාපනය නම් පෞරුෂත්වයක් විසින් පෞරුෂත්වයක් කෙරෙහි බලපාමින් අන්‍යොන්‍ය වශයෙන් ක්‍රියාත්මක වෙමින් පවතින ක්‍රියා සන්තති යයි.
II. මේ ක්‍රියා සන්තතිය සවිඥයිකව මෙන්ම මෙහිදී අධ්‍යාපනය කරවන්නා අන්‍යයාගේ වර්ධනය ඔපමට්ටම් කිරීමේ අරමුණ දරයි.
III. ඉහත සඳහන් වර්ධනය ඔපමට්ටම් කිරීමේ කාර්යය දෙයාකාරය.

(අ). අධ්‍යාපනය කරවන්නාගේ පෞරුෂය කෙළින්ම අධ්‍යාපනය කෙරෙහි බල පෑමෙන් හා,

(ආ). දැනීම නොයෙක් ආකාරයෙන් පාවිච්චි කිරීමෙනි. (කාරියවසම් සහ කාරියවසම්, 1964, පිටුː 11-12)

ජෝන් ඩිවී නමැති ඇමරිකානු දාර්ශනිකයා අධ්‍යාපනය විසින් කළ යුතුව ඇත්තේ මනුෂ්‍යයාත්, පරිසරයත් අතර සම්බන්ධතාවක් ඇති කිරීම ලෙස දක්වයි (කාරියවසම් සහ කාරියවසම්, 1964, පිටුː 13).

අධ්‍යාපනයේ පරමාර්ථ කලින් කලට සමාජයෙන් සමාජයට වෙනස් වේ. අධ්‍යාපනය මඟින් මූලිකව පුද්ගලයාගේ වර්ධනය ඇති කළ ද එය සමාජයේ ප්‍රගතියට ද හේතු වේ. එනම් පෞද්ගලික සහ සමාජීය පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අධ්‍යාපනය වැදගත් වේ. මාජරී රීවිස් නැමති සමාජ විද්‍යාඥවරියගේ අදහස අනුව " අධ්‍යාපනයෙහි ඇති තේරුම් ගැනීමට දුෂ්කර, පරස්පර විරෝධී බව නම් එය ඉතා පෞද්ගලික ක්‍රියාවක් වන අතරට සමාජයීය ක්‍රියාවක් ද වීමයි" (කාරියවසම් සහ කාරියවසම්, 1964, පිටුː 19). අධ්‍යාපනය නිර්මාණය කිරීමට සීමා නොවී පවතින අදහස් යලි විමසීමට ලක්කරමින් වර්තමානයට සහ අනාගතයට සුදුසු පරිදි සකස් කිරීම සිදු කරයි. හර්බට් ස්පෙන්ස්ර්ගේ අදහස අනුව අධ්‍යාපනයෙන් කළ යුත්තේ පුද්ගලයා සම්පූර්ණ ජීවිතයකට සූදානම් කිරීම බවයි. එහිදී අනාගත වැඩිහිටි ජීවිතයට ළමා අවධියේ සිටම පුරුදු කිරීමයි (කාරියවසම් සහ කාරියවසම්, 1964, පිටුː 26).

1505 න් පසු පෘතුගීසි හා ලන්දේසි පාලන වකවානුවල දී පාසල කේන්ද්‍රකොටගෙන අධ්‍යාපනය ලබා දීම ආරම්භ විය. ඔවුන් ද සාම්ප්‍රදායික ක්‍රම අනුගමනය කරමින් ක්‍රිස්තියානි කතෝලික පල්ලිය කේන්ද්‍ර කරගනිමින් ආගමික මධ්‍යස්ථාන හරහා අධ්‍යාපනය ලබා දීම සිදු කෙරිණි. මොවුන් අධ්‍යාපනය හරහා දැනුම ලබා දීමට අපේක්ෂා නොකළ අතර ඔවුන්ගේ අභිප්‍රාය වූයේ ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත කිරීමය. කුඩාකල සිටම ක්‍රිස්තියානි ආගමට ළමුන් හරවා ගැනීම මෙමඟින් සිදු වූ අතර රැකියා හා වරප්‍රසාද ලබා ගැනීමේ දී ක්‍රිස්තියානි ආගමිකයකු වීම විශේෂ කොට සැලකීය.

1796 දී ලංකාවට පැමිණෙන බ්‍රිතාන්‍යයන් තුළ අධ්‍යාපනය පිළිබඳ වැඩි අවධානයක් නොවූ අතර ඔවුන්ගේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ සිය පාලනය ව්‍යාප්ත කිරීම හා විධිමත්ව ස්ථාපනය කිරීමය. ලන්දේසින් විසින් පවත්වාගෙන එනු ලැබූ පාසල් එලෙසම ක්‍රියාත්මක වූ අතර මිෂනාරි පාසල්වල ආරම්භය සිදු විය. බ්‍රිතාන්‍ය පාලන

යුගය තුළ අධ්‍යාපන ක්‍රමය මූලික වශයෙන් යටත් විජිත පාලකයන්ගේ අවශ්‍යතා මත සිදු විය. බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාගේ පාලන සමයේ සිදු වූ වැදගත් සිද්ධියක් නම් 1817 දී කොළඹ ආච්ඩිකන් පදවියක් ඇති කිරීමයි. එංගලන්ත සභාවට ලංකාවේ අධ්‍යාපන පරිපාලනය භාරවීම මේ නිසා සිදු විය (කුලරත්න, 2002, පිටුඃ 18). ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය ලබා දීම මිෂනාරි පාසල් ආශ්‍රිතව සිදු වූ අතර කෝල්බෲක් - කැමරන් කොමිෂන් වාර්තාව තුළ ද අධ්‍යාපනික අංශ පිළිබඳ සැලකිල්ලක් දක්වා නොමැත. කොල්බෲක් කොමිසම බෞද්ධ පාසල් අධ්‍යාපනය පිළිබඳ නොසලකා හරින ලදී. කෝල්බෲක් කොමිසම රජයේ සියලුම පාසල් පරිපාලනය සඳහා "පාසල් කොමිසම" නමැති සංවිධානයක් ඇති කළ අතර ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය කිරීම, ක්‍රිස්තියානි මිෂනාරි අධ්‍යාපනයට ආධාර හා අනුබල ලබා දීම සිදු විය.

1832-1838 ඉන්දියාවේ උත්තරීතර උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් කටයුතු කළ තෝමස් බැබිංටන් මැකෝලේ සාමිවරයා අධිරාජ්‍යවාදී පාලනය ව්‍යාප්ත කිරම සඳහා අධ්‍යාපනික වැඩපිළිවෙළක් පිළිබඳ න්‍යායක් ඉදිරිපත් කළේය. මෙය " ඉන්දියාවේ අධ්‍යාපනය පිළිබඳව මැකෝලේගේ න්‍යාය" පත්‍රය ලෙස හැඳින්වේ. මේ අනුව එවකට ඉන්දියාවේ පැවතී භාෂා ප්‍රතික්ෂේප කළ අතර ඉංග්‍රීසි ඉගෙනීමට ස්වදේශිකයන් පොළඹවමින් ඉංග්‍රීසීන් අනුකරණය කරන "කළු සුද්දන් පිරිසක්" ඉන්දියාවේ බිහි කළේය. ඉන්දියාවේ බ්‍රිතාන්‍ය පාලනයට සමාන්තරව ලංකාවේ ද අධ්‍යාපනයේ වෙනස්වීම් රාශියක් සිදු විය. ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබීම මෙලෙස ඉංග්‍රීසි අධ්‍යාපනය ව්‍යාප්ත වීමට හේතු විය. 1968 දී ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුවක් අධ්‍යක්ෂවරයකු යටතේ පිහිටු වීය. නමුත් ලබා දුන් අධ්‍යාපනය සතුටුදායක නොවීය. 1907 දී ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවත්වුණු පාසැල් ගැන පරික්ෂා කිරීමට විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයේ සිට පැමිණ මාස ගණනාවක් පාසැල් සියල්ලටම වාගේ ගොස් කරුණු සොයා බැලූ ජේ. ජේ. ආර්. බ්‍රිජ් නම් රාජ්‍ය පාසල් පරීක්ෂකවරයාගේ වාර්තාව අනුව "අවුරුදු 7 සිට 10 දක්වා වූ මුළු පාසැල් කාලයක් තුළ ඉතා පටු විෂය මාලාවක් යුතු විභාගයම අරමුණු කරගත් ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලැබීමෙන් පසු පාසැල හැර යන්නවුන්ගෙන් 20% ක් පමණ දේශීය කනිෂ්ඨ විභාගය සමත් වෙයි. අනෙක් 80% ට ඇත්තේ ඉතා දුර්වල ඉංග්‍රීසි දැනුමක් වන අතර ලිපිකරු රැකියාවකට පවා එය ප්‍රමාණවත් නොවේ (ගුණපාල, 2015 පිටුඃ 43).

මේ පිළිබඳව සෙවීමට 1912 මැක්ලියෝඩ්ගේ සභාපතිත්වයෙන් කොමිසමක් රජය විසින් පත් කරන අතර එම කොමිසන් වාර්තාවේ ප්‍රතිඵලයක් ලෙස 1912 දී ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව යන නමින් අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු යටතේ පිහිටවනු ලැබිය. එසේම 1920 පමණ වන විට ගුරු අධ්‍යාපනය තුළ වැටුම් ක්‍රම ආදිය පිළිබඳව ද රජයේ විශේෂ අවධානය යොමු වී යම් ප්‍රතිසංස්කරණ සිදු විය (ගුණපාල, 2015, පිටුඃ 44).

1931 වන විට ඩොනමෝර් රාජ්‍ය මන්ත්‍රණ සභා යටතේ විවිධ අංශවල පාලනය ගෙනයෑම සඳහා අංශ 7 ක් යටතේ විධායක කාරක සභා 7 ක්‍රියාත්මක වූ අතර අධ්‍යාපනය ඉන් එක් කාරක සභාවක් විය. මෙම කාලයේ දී ජනතාව තුළ අධ්‍යාපනය පිළිබඳ උනන්දුවක් තිබූ අතර රටේ මූලික අධ්‍යාපනය ස්වභාෂා පාසල් මඟින් සපයනු ලැබීය. 1931 අධ්‍යාපන අධ්‍යක්ෂ පරිපාලන වාර්තා අනුව ලංකාවේ මුළු වැඩිහිටි

ජනගහනයෙන් කුමන භාෂාවකින් හෝ සාක්ෂරතාවය පොදුවේ 47.9 විය (ගුණපාල, 2015, පිටුඃ 47). කනිෂ්ඨ හෝ ජ්‍යෙෂ්ඨ මට්ටම දක්වා සිංහලෙන් අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව හිමි වූ අතර ඉන් ඉදිරියට ඉගෙන ගත හැකි වූයේ ඉංග්‍රීසියෙන් පමණි. ඉංග්‍රීසි පාසල්වල ඉගෙනීම සඳහා පාසල් ගාස්තුවක් අය කළ අතර එමනිසා අධ්‍යාපනය ප්‍රභූපන්තිය සඳහා වෙන් විය. මොවුන් පාලක පන්තියට නැකම් කියන දේශීයත්වය හෙළා දකින පිරිසක් වූ අතර මොවුන් සාමාන්‍ය ජනතාවගෙන් ඈත් වී සිටීමට උත්සහ කළේය. පසුකාලීනව දේශීයත්වයේ හා ජාතිකතවයේ පිබිදීම නිසා මෙම තත්වය කෙමෙන් වෙනස් වීම සිදුවෙන අතර අනගාරික ධර්මපාල, එස්. මහින්ද හිමි, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි යන ගිහි පැවිදි දෙපක්ෂයේම දායකත්වය මේ සඳහා හිමි විය. ආරුමුගම් නාවලර් වැනි හින්දු ප්‍රබුද්ධයෝ ද මිෂනාරි අධ්‍යාපනයෙන් මිදීමට උනන්දු වූ අතර මෙම තත්වය ලාංකික ජනතාව තුළ ජාතික පිබිදීමකට හේතු විය.

ලංකාවේ අධ්‍යාපන ක්ෂත්‍රය තුළ පෙරලියක් ඇති කළ අවස්ථාවක් ලෙස 1943 මාධ්‍ය විද්‍යාල පිහිටුවීම දැක්විය හැකිය. සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා විසින් ගම්බද ළමුන්ට ද ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනීම සඳහා අවස්ථාව ලබා දීමේ අරමුණින් මාධ්‍ය විද්‍යාල ආරම්භ කළ අතර ඔහු ලංකාවේ ප්‍රථම අධ්‍යාපන ඇමතිවරයා ද විය. වර්තමානයේ පවා ක්‍රියාත්මක නීතිය වන 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥපනත සම්මත වීම කන්නන්ගර යුගයේ සිදු වූ වැදගත් සිදුවීමකි. මෙලෙස කන්නන්ගර මහතා අධ්‍යාපනයේ සංවර්ධනය සඳහා කළ සේවය ඉමහත්ය. කන්නන්ගර වාර්තාවේ අධ්‍යාපනයේ පරමාර්ථ 03ක් දක්වයි.

01. මානසික සංවර්ධනය හා මානසික විනය ඇති කිරීම

02. සංස්කෘතික හා චරිත සංවර්ධනය

03. ව්‍යක්තභාවය, දක්ෂතාව හා කාර්යක්ෂමභාවය දියුණු කිරීම (කුලරත්න, 2002, පිටුඃ 67).

කන්නන්ගර මහතා යෝජනා කළේ බාලාංශයේ සිට විශ්වවිද්‍යාල දක්වා නොමිලේ අධ්‍යාපනය දිය යුතු බවත් නොමිලේ කෑම බීම ඉඳුම් හිටුම් ලබා දීමට මුදල් වෙන් කළ යුතු බවයි. එමෙන්ම නිදහස් අධ්‍යාපනය සපයන පාසල්වල සේවය කරන සුදුසුකම් සියලුම ගුරුවරුන්ට රජයෙන් වැටුපක් ගෙවිය යුතු බවට ද යෝජනා කළේය. කන්නන්ගර කමිටු යෝජනාවලින් වැදගත් යෝජනා වූයේ නිදහස් අධ්‍යාපනය මව් බස පිළිබඳ යෝජනාවයි. 1945 දී ක්‍රියාත්මක කරන ලද්දේ මෙම කමිටු යෝජනා වුව ද අනෙකුත් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා 1947 අංක 26 දරන ආඥා පනත පැනවීම සිදු විය. මෙම ආඥා පනත මඟින් පාසල්වල ආගම ඉගැන්වීම, අවුරුදු 5-16 අතර වයස් සීමාවේ ළමයින්ගේ අධ්‍යාපනය අනිවාර්ය කිරීම, වතු ආශ්‍රිත ළමයින්ට අධ්‍යාපන අයිතිය ලබා දීම වැනි විශේෂ වෙනස්කම් කිහිපයක් සිදුවිය.

ශතවර්ෂයකට අධික කාලයක් තුළ යටත් විජිත අධ්‍යාපනය ක්‍රමයේ පැවති මූලික වෙනසක් මෙම යෝජනා මඟින් ඇති විය. 1921 දී ඇරඹි විශ්වවිද්‍යාල කොලීජිය හා

කොළඹ විද්‍යා විද්‍යාලය සම්බන්ධ කරමින් 1942 දී ලංකා විශ්වවිද්‍යාල ඇති කිරීම උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් මෙම යුගයේ ඇති වූ වැදගත් වෙනස්කමක් දැක්විය හැකිය. මෙලෙස බ්‍රිතාන්‍ය පාලන යුගය තුළ අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ වෙනස්කම් රාශියක් සිදු වූ අතර වර්තමානය දක්වා ද ඒවායේ ප්‍රබලතා හා දුබලතාවල බලපෑම දක්නට ලැබේ. ඉන්දියාව තුළ ද මහත්මා ගාන්ධි ප්‍රධාන දේශප්‍රේමීන්ගේ උත්සහයෙන් 1947 වන විට බ්‍රිතානයෙන් ඉන්දියාව ස්ථිරව නිදහස ලබා ගන්නා අතර 1948 වන විට ලංකාවට ද ඩොමීනියන් නිදහසක් හිමි විය. 1956 දී සිංහල භාෂාව රාජ්‍ය භාෂාව ලෙස ප්‍රකාශයට පත් වීම සිදු වුව ද ඉංග්‍රීසි භාෂාවේ බලපෑමේ ඉවත් නොවීය. තවද බ්‍රිතාන්‍යයන් අනුකරණය කරන්නන් රටේ සිටි අතර නිදහසින් පසුද ඔවුන් පාලන තන්ත්‍රයට සම්බන්ධ වුව ද දේශීය උන්නතිය උදෙසා ඔවුන්ගේ සේවයක් සිදු නොවීය.

### ලෝකයේ පුස්තකාල ආරම්භය

පුස්තකාල ඉතිහාසය විෂය ක්ෂත්‍රය තුළ දී "ලේඛන කලාව" සඳහා වැදගත් ස්ථානයක් හිමි වේ. "දැනුම" පරපරකින් පරපුරකට උරුම කරලීමේ දී ලේඛන කලාවේ මෙහෙය අතිවිශාලය. මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට ලේඛන කලාව සංවර්ධනය වෙමින් පැවත ඇත. ලෝකයේ ගංගා නිම්න ආශ්‍රිතව ආරම්භ වූ පැරණිම ශිෂ්ටාචාර ආශ්‍රිතව පවා ලේඛන ක්‍රමයන් භාවිතා කළ බවට සාක්ෂි හමු වී ඇත. මුල්කාලීනව පැරැන්නන් තමන්ගේ සිතට ආ අදහස්, ජීවිතයේ විවිධ අවස්ථා විවිධ ද්‍රව්‍ය මත සටහන් කිරීමට පුරුදු වී සිටියහ. පැරණි ශිෂ්ටාචාරකයින් මුලින් ලිවීම සඳහා භාවිත කළ ද්‍රව්‍ය වූයේ මැටි පුවරුය (වීරසිංහ, 2011, පිටුː 04). මෙම මැටි පුවරු සංරක්ෂණය කිරීම සඳහා මැටි පුවරු ගින්නෙන් පුළුස්සා ගැනීමත්, විශාල මැටි ආවරණ භාවිතා කිරීමත් සිදු විය. මෙම මැටි පුවරු ගබඩා කිරීම සඳහා පුස්තකාලයක් ද රාජකීය පුස්තකාලධිපතිවරයෙක් ද සිටි බවට කැණීම්වලින් සාක්ෂි හමු වී ඇත. මෙම ලියවිලි ආරක්ෂා කිරීම පෞරාණික පුස්තකාල භාරකාරයන්ගේ කාර්යභාරය වී තිබිණි. පුස්තකාලයක පිළිබඳ ඉදිරිපත් වී ඇති නිර්වචන ඇසුරින් එහි ව්‍යුහය හා කාර්යභාරය පිළිබඳ අදහසක් ලබා ගත හැකිය.

"වාර්තාගත වන තොරතුරු සෙසු අයට ප්‍රයෝජනයට ගත හැකි පරිදි ලබා ගැනීම, සැකසුම, ගබඩා කිරීම, සමුද්ධකරණය හා සන්නිවේදනය පිණිස ඇති ප්‍රධාන විඥාපන ඒකකයක් වනුයේ පුස්තකාලයයි " (ජයතිස්ස, 1999, පිටුː 1)

"මිනිසා සතු ඓතිහාසික ආයතනයක් වන පුස්තාකලය, මිනිසා සමඟ ම ප්‍රභවය වී, මිනිසා සමඟ ම වර්ධනය වෙමින් මිනිසාගේ දැනුමෙන් මිනිසාටම සේවය සලසන අම්ල වූ වැදගත්කමක් ඇති මානව පරිණාමය හා සමගාමී ව පරිණාමය වන්නා වූ සජීවී වස්තුවකි" (සමරකෝන්, 2003, පිටුː 16)

රේමන් අර්වින් පුස්තකාල විද්‍යාව මෙසේ නිර්වචනය කර ඇත. "
එකතුවත්, ගොඩනැගීමත්, සංවිධානය කිරීමත්, සංරක්ෂණය කිරීම සහ වාර්තාගත සන්නිවේදනය උපයෝගී කර ගැනීමත් පිළිබඳ විද්‍යාව පුස්තකාල විද්‍යාව ය. (සමරකෝන්, 2003, පිටුː 17)

මිසරයේ පේරෝවරුන් ලේඛන ද්‍රව්‍ය ලෙස පැපිරස් (Papyrus) නමින් හඳුන්වන පත් වර්ගයක් යොදා ගත්හ. ක්‍රි. පූ. 3500 දී ඊජිප්තු වැසියෝ මෙම පැපිරස් ලේඛන ද්‍රව්‍ය ලොවට හඳුන්වා දුන්හ (වීරසිංහ, 2011, පිටුඃ 11). මෙම පැපිරස් පත්‍ර විශේෂිත ක්‍රමවේදයකට අනුව සකස් කර ගන්නා අතර එම ලේඛන බහාලීම සඳහා විශාල මැටි බඳුන්, සම් සහ ලෝහ ආවරණ භාවිතා කර ඇත.

ලෝකයේ පුස්තකාල ඉතිහාසය තුළ ග්‍රීක යුගය වැදගත් වේ. ඉතා දියුණු ලිඛිත සාහිත්‍යයකට හිමිකම් කියන ග්‍රීක යුගය තුළ ප්ලේටෝ, ඇරිස්ටෝටල් වැනි ලේඛකයන් ලේඛනය සඳහා විශාල දායකත්වයක් සැපයීය. ඇරිස්ටෝටල් විසින් " ඇලෙක්සැන්ඩ්‍රියානු පුස්තකාලය" නමින් පුස්තකාලයක් ද නිර්මාණය කරන ලද අතර එහිදී පොත් පරිවර්තනය කිරීම් ද සිදු විය. මෙම පුස්තකාලයෙහි විශාල වශයෙන් පැපිරස් රෝල් පවතී අතර තාක්ෂණික කටයුතු සඳහා වෙනම අංශයක් ද පිහිටුවා තිබිණි. ග්‍රන්ථ වර්ග කිරීමේ හා ලියාපදිංචි කිරීමේ කටයුතු පුස්තකාල සහායකවරුන් විසින් සිදු කළ අතර පුස්තකාලය සංවිධානය කිරීමේ දී සූචිකරණ ක්‍රමයක් අනුගමනය කර ඇත. මෙම රාජකීය පුස්තකාලයෙහි පුස්තකාලයාධිපති පත් කිරීම අධිරාජ්‍යයා විසින් සිදු කළ අතර ගෞරවාන්විත තනතුරක් විය. ක්‍රි. පූ. 4 ශතවර්ෂයේ දී ඇතැන්ස්වල මහජන පුස්තකාලයක් තිබූ බවට සාධක හමු වී ඇත (වීරසිංහ, 2011, පිටුඃ 25). මෙලෙස විවිධ අධිරාජ්‍යයන්ගේ අනුග්‍රහය යටතේ පුස්තකාල පද්ධතිය සංවර්ධනය වූ අතර ග්‍රීකයේ විසූ ඉයුමිනස් (Eumenes) රජුට පසුකාලීනව පැපරස් පත්‍ර ලබා ගැනීමේ දී ඇති වූ දුෂ්කරතා හේතුවෙන් පාර්ච්මන්ට් හා වෙලම් ලෙසින් නව ලේඛන ද්‍රව්‍යයක් සඳහා යොමු විය. මේවා සත්ව හම් විශේෂයකි. විශේෂයෙන් බැටලුවන්, ගවයන්, එළුවන් වැනි සතුන්ගෙන් ලබා ගන්නා සම්වලින් සදා ගන්නා ලදී (වීරසිංහ, 2011, පිටුඃ 27).

රෝම යුගය සම්භාව්‍ය ලේඛනයේ ඉසුරුමත් යුගය ලෙස සැලකෙන අතර පෞද්ගලික පුස්තකාලවල සීඝ්‍ර වර්ධනයක් දැකිය හැකි විය. රෝමවරුන්ගේ පුස්තකාල මැනවින් සංවිධානය කල ඒවා විය. රෝමයේ ප්‍රකාශන නීතියක් ක්‍රියාත්මක වූ අතර රෝමවරුන්ගේ පවතී රණකාමිතාවය අනෙකුත් රාජ්‍යයන් ආක්‍රමණය කරමින් පොත්පත් ලබා ගැනීමට හේතු විය. පවුලස් (Paulus) නමැති රෝම අධිරාජ්‍යයා ක්‍රි. පූ. දෙවන ශතවර්ෂයේ දී මැෂිඩොනියන්වරු පරදා ග්‍රීක පුස්තකාලවල තිබූ පොත්පත් රාශියක් රෝමයට ගෙනවිත් ඇත (වීරසිංහ, 2011, පිටුඃ 30). රෝම යුගයේ දී මහජන පුස්තකාල ඉදිකිරීම් ආරම්භ වූ අතර පසුව ඇති වූ ස්වාභාවික උවදුරු හා සතුරු ආක්‍රමණ නිසා පුස්තකාල විනාශ විය.

රෝම යුගයේ අධ්‍යාපනික ආයතන හා විශ්ව ඥානය විනාශ වීමට නොදී රැක ගැනීම උගතුන්ගේ ප්‍රධාන වගකීම විය. ක්‍රිස්තියානි පූජකවරුන්ගේ මූලිකත්වය යටතේ අශ්‍රමවල පුස්තකාල පිහිටුවීම ආරම්භ වූ අතර මධ්‍යතන යුගයේ දී ඉතා විසිතුරු ලෙස ග්‍රන්ථ නිර්මාණය විය. රෙදි වර්ග, සත්ව සම් යොදා ගැනීම, පොත්වල අකුරු ඔබ්බවීම, විශාල ග්‍රන්ථයන්හි බැම්ම සඳහා ලී උපයෝගී කර ගැනීම කැපී පෙනේ. මධ්‍යතන යුගයේ දී බටහිර රටවල විශ්වවිද්‍යාල හා ඊට අනුබද්ධ කොලීජ බිහිවීම ආරම්භ වූ අතර පසුකාලීනව මේවා පුස්තකාල ඉතිහාසය තුළ වැදගත් ස්ථානයක්

හිමි කර ගන්නා ලදී. ක්‍රි. පූ. 1500 පමණ වන විට විශ්වවිද්‍යාල 50-60 අතර ප්‍රමාණයක් යුරෝපයේ බිහි විය (වීරසිංහ, 2011, පිටුː 53). ඉන් පසු ලෝකයට උදාවන අඳුරු යුගයේ දී කොන්ස්තන්තිනොපල් රාජ්‍යය තුළ රාජකීය පුස්තකාලයක් පැවතිය ද අරාබි ආක්‍රමණ නිසා එය විනාශ විය. පසුව ක්‍රි. පූ. 622 දී මුස්ලිම් යුගය ආරම්භ වීමත් සමඟ කුරාණය විශේෂ ග්‍රන්ථයක් වූ අතර පුස්තකාලය ඉතා සීඝ්‍රව වර්ධනය විය. පසුව ඇති වූ සිවිල් යුදමය තත්වය මෙම පුස්තකාලවල විනාශයට හේතු විය.

ආසියානු කලාපිය චීන ජාතිකයන් කඩදාසි ලොවට හඳුන්වාදීම තුළින් පුස්තකාල ලෝකයේ විශාල වෙනසක් ඇති කළහ. එමෙන්ම මුද්‍රණ ක්‍රමයේ නිර්මාතෘවරුන් වන්නේ ද චීන ජාතිකයන්ටය. නමුත් ලෝකයේ පවත්නා මතය වන්නේ ජර්මන් ජාතික ගුටෙන්බර්ග් විසින් 15 වන ශත වර්ෂයේ දී මුද්‍රණ යන්ත්‍රය සොයා ගත් බවය. මුද්‍රණ ශිල්පය බිහිවීමත් සමඟ යුරෝපිය රටවල් පොත්පත් නිෂ්පානයේදී ප්‍රධාන ස්ථානයක් හිමි කර ගත අතර මෙය පුස්තකාල ක්ෂෙත්‍රයේ විශාල සංවර්ධනයට හේතු විය. 16-19 ශතවර්ෂවල ප්‍රංශයේ තිබූ බොහෝ පුස්තකාල අයත් වූයේ විශ්වවිද්‍යාලවලට සහ උගතුන්ටය (වීරසිංහ, 2011, පිටුː 59). මේ හා සමගාමීව ඕස්ට්‍රියාව, ජර්මනිය, බෙල්ජියම් රාජ්‍යය, නෙදර්ලන්තය, ඩෙන්මාර්කය, නෝර්වේ, ස්වීඩනය, පින්ලන්තය, ස්පාඤ්ඤය, පෘතුගාලය ආශ්‍රිතව පුස්තකාල ව්‍යාපාරය සීඝ්‍රයෙන් ව්‍යාප්ත විය.

### ශ්‍රී ලංකාවේ පුස්තකාල ඉතිහාසය

ශ්‍රී ලංකාවේ පුස්තකාල ඉතිහාසය මහින්දාගමනය දක්වා විහිදෙයි. මහින්දාගමනයත් සමඟ අක්ෂර කලාව ලාංකිකයන්ට ලැබීමත් සමඟ ලේඛනය ලංකාවට උරුම විය. නමුත් මහින්දාගමනයට පෙර ද මෙරට දියුණු අක්ෂර ක්‍රමයක් පැවතී බවට සාධක ඇත. මුල් කාලීනව ආරාම ආශ්‍රිතව ගල් ලෙන්වල සටහන් යොදා ඇති අතර මහාවිහාරය ආශ්‍රිතව අධ්‍යාපන පීඨයක් පැවතිණි. මෙම භික්ෂු පීඨයෙහි පුස්තකාලයක් පැවති අතර එහි විශාල වශයෙන් බෞද්ධ ග්‍රන්ථ විය. මහාවිහාරයට අමතරව අභයගිරි හා ජේතවනාරාමය අධ්‍යාපන විද්‍යා පීඨ අශ්‍රිතව පුස්තකාල පැවති අතර ථෙරවාදී හා මහායානික අදහස් ඇතුළත් පොත්පත් පැවති බවට සාක්ෂි හමු වී ඇත. නිකාය භේදය ආරම්භ වීමත් සමඟ මහාවිහාරය විනාශ වූ අතර ධර්මය කටපාඩමෙන් රැක ගැනීම අසීරු විය. ලංකාවේ පුස්තකාල ඉතිහාසයේ වැදගත් කඩඉමක් ලෙස ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සිදු විය. සිලාකාල රජුගේ කාලයේ " ධම්මධාතුව" නැමැති ග්‍රන්ථයක් සඳහා වාර්ෂිකව උත්සව පැවැත් වූ බව මහා වංශයේ සඳහන් වේ.

අනුරාධපුර යුගයේ සාහිත්‍ය හා පුස්තකාල පිළිබඳ වැඩිදුර තොරතුරු ඉතිහාසයේ සඳහන් නොවුන ද ඇතැම් සිදුවීම් මුල්කරගෙන එකල පවතී ලේඛන කලාව හා ග්‍රන්ථ සාහිත්‍ය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය. ථූපවංශයේ සඳහන් වන ආකාරයට දුටුගැමුණු රජතුමා සතුව "පිං පොතක්" තිබූ බවත් බුද්ධදාස රජතුමා සතුව වෙද පොතක් තිබූ බවත් ඉතිහාසයේ සඳහන් වේ. අනුරාධපුර යුගයේ විශිෂ්ට කලා නිර්මාණයක් ලෙස සැලකෙන සීගිරියේ කැටපත් පවුරේ ඇති ගීවලින් එකල පැවති සාහිත්‍ය මෙන්ම සාක්ෂරතාවය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය.

පොළොන්නරු යුගය වන විට චෝල ආක්‍රමණ නිසා විකාශනය පත් වූ බෞද්ධ පොත පත නැවත ආරක්ෂා කිරීමට පළමු වන විජයබාහු රජතුමා කටයුතු කළ අතර ඒ සඳහා අවශ්‍ය භික්ෂූන් හා ග්‍රන්ථ මෙරටට ගෙන්වූ බවට චූල වංශයේ සඳහන් වේ. පුස්තකාල සඳහා අවශ්‍ය පොත්පත් රචනා කිරීමට ලේඛකයන් දිරිමත් කිරීමට පළමුවන විජයබාහු රජතුමා විසින් සිදු කරන ලදී. ලංකා ඉතිහාසයේ ප්‍රථම වරට පුස්තකාල පිළිබඳව විධිමත්ව සටහන් කරන රජ කෙනෙක් ලෙස පළමුවන පරාක්‍රමබාහු රජතුමා සඳහන් කළ හැකිය. පොත්ගුල් වෙහෙර පොළොන්නරුවේ ඉදිකළ රාජකීය පුස්තකාලයෙහි නටබුන් ලෙස සලකේ. නිශ්ශංක මල්ල රජුගේ කාලයේ වැදගත් ලිපි ලේඛන තඹ පත් මත ලිවීම සිදු කළ අතර පොත්පත් ආරක්ෂා කිරීමට "පෝත්වරුන්" නමින් විශේෂ නිලධාරීන් ද විය. කාලිංග මාඝ ආක්‍රමණයෙන් පොළොන්නරු රාජධානිය බිඳ වැටීමත් සමඟ පොත්පත් විශාල වශයෙන් විනාශ විය.

මින්පසු පුස්තකාල ඉතිහාසය සම්බන්ධයෙන් වැදගත් යුගයක් ලෙස සැලකෙන දඹදෙණිය යුගයේ දී තුන් වන විජයබාහු රජතුමා විනාශ වූ පොත්පත් නැවත පිටපත් කළහ. මේ යුගයේ ලියන ලද සෑම සාහිත්‍ය ග්‍රන්ථයක්ම පාහේ මෙරට සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ බවට පත්ව ඇත. ක්‍රි. ව. 1293-1347 කුරුණෑගල යුගයේ දී සිදු වූ විශේෂ සිදු වීම ලෙස සිංහල ජාතක පොත බිහි වීම දැක්විය හැකිය. ගම්පොල යුගයේ දී සන්දේශ කාව්‍ය ආරම්භ වීමත් සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ යුගයේ දී පිරිවෙන් අධ්‍යයාපනය ආරම්භ වන අතර එම සෑම පිරිවෙනකටම පොත්ගුල් පිහිටුවා ඇත. මෙතෙක් ලේඛන කලාව සඳහා තල්පත්, තඹ තහඩු වැනි සාම්ප්‍රදායික ද්‍රව්‍ය යොදා ගත්ත ද ක්‍රි. ව. 1505 දී පෘතුග්‍රීසීන්ගේ පැමිණීමත් සමඟ කඩදාසි ලංකාව තුළ භාවිතය ආරම්භ විය. 1720 දී ලන්දේසීන් විසින් මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දුන්න ද එහි විවිධ කාර්මික ගැටලු ඇති වීම හේතුවන් එය සාර්ථක නොවීය. පසුව ලන්දේසි ආණ්ඩුකාරවරුන්ගේ උත්සහයෙන් 1737 දී පළමුවෙනි පොත මුද්‍රණයෙන් නිකුත් විය. ඉන්පසු ලන්දේසි ආණ්ඩුව පාලන කටයුතු සඳහා මුද්‍රණ යන්ත්‍ර භාවිතා කළ ද 1797 දී බ්‍රිතාන්‍යයන් මුහුදුබඩ ප්‍රදේශ ආක්‍රමණය කිරීමෙන් පසු එම මුද්‍රණ යන්ත්‍ර ඉංග්‍රීසින් අතට පත් විය. ලංකාවේ ප්‍රථම වාර ප්‍රකාශනය 1802 දී නිකුත් කරනු ලැබීය. පසුව මෙරට වෙහෙර විහාර ඉංග්‍රීසින්ගේ ප්‍රහාරයට ලක් වුව ද 1831 පත්ව ආ රොබට් විල්මට් හෝර්ටන් ආණ්ඩුකාරවරයා 1832 ප්‍රථම පුවත්පත වූ කලම්බු ජර්නල් ආරම්භ කළ අතර 1839 දී ලංකාවේ තුළ පුවත්පත් මුද්‍රණය හා ප්‍රකාශනය පාලනය කිරීම සඳහා ව්‍යවස්ථාවක් ද පනවනු ලැබීය.

1801 දී දායක මුදල් අය කරන පුස්තකාලයක් කොළඹ දී පිහිටුවන අතර ප්‍රාචීන පුස්තකාලයක් පිහිටු විය. එය ලක්දිව ප්‍රථම මහජන පුස්තකාලය විය. 1877 දී ශ්‍රීමත් විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරවරයාගේ උත්සාහයෙන් කෞතුකාගාර පුස්තකාලය ආරම්භ කළ අතර පසු කාලීනව එය තැන්පතු පුස්තකාලයක් බවට පත් විය. කොළඹ පුස්තකාලය හා පිටකොටුවේ පුස්තකාලය එක් කිරීමෙන් 1925 දී කොළඹ මහජන පුස්තකාලය ආරම්භ වන අතර ඉතා ශක්තිමත් පුස්තකාල පද්ධතියක් ලෙස සැලකෙන විශ්වවිද්‍යාල පුස්තකලයන්හි ආරම්භය 1921 දී ලංකා විශ්වවිද්‍යාල කොලීජිය බිහිවීමත් සමඟ සිදු විය. පසු කාලීනව විවිධ දෙපාර්තමේන්තු ආරම්භ වීමත් සමග ඒ ඒ දෙපාර්තමේන්තුවලට අයත් විශේෂිත පුස්තකාල ආරම්භ විය. 1945

දී නිදහස් අධ්‍යාපන පනත හඳුන්වා දීමත් සමග 1961 දී පත් කරන ලද අධ්‍යාපන පිළිබඳ කොමිෂන් සභාව ද පාසල් පුස්තකාල පිහිටුවීම නිර්දේශ කළහ. 1970 දී ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවීමත් සමඟ පුස්තකාල ක්ෂත්‍රයට සුවිශේෂී වූ ජාතික පුස්තකාලය අවශ්‍යතාව 1990 දී ජාතික පුස්තකාලය විවෘත කිරීමෙන් සම්පූර්ණ කරන ලදී. මෙය දීර්ඝ කාලීන සහ බොහෝ දෙනෙකුගේ උත්සහයක ප්‍රතිඵලයකි. 1960 දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පිහිටු වන ලද අතර 1974 අංක 20 දරන පනතින් මෙය නීතිගත කරන ලදී.

පුස්තකාල ඉතිහාසය තුළ පුස්තකාල අධ්‍යාපනයට වැදගත් ස්ථානයක් හිමි වේ. ඩී. ඒ. රෙඩ්මන්ට් නැමැති විශේෂඥයා 1951 දී පුස්තකාලවේදීන් සඳහා කෙටි කාලීන පාඨමාලාව ආරම්භ කරන ලද අතර පසුව ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අනුග්‍රහයෙන් අර්ධකාලීන පාඨමාලා දක්වා ව්‍යාප්ත කර ඇත. අද වන විට විශ්වවිද්‍යාල පද්ධතියෙන් ඉදිරියට ගොස් බාහිර, සාමන්‍යවේදී, විශේෂවේදී, පශ්චාත් උපාධි දක්වා ව්‍යාප්තව වී ඇත. 1998 වසර වන විට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය 1998 අංක 51 දරන පනතින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ලෙස වෙනස් විය. මෑතකාලින පුස්තකාල ඉතිහාසයේ අභාග්‍ය සම්පන්න සිදුවීමක් ලෙස 1990 දී සිදු වූ යාපනය විශ්වවිද්‍යාල විනාශය දැක්විය හැකිය. මෙලෙස ශ්‍රී ලංකාව තුළ පුස්තකාල ඉතිහාසය විවිධ බාධක හැලහැප්පීම් මැද විකාශය වෙමින් වර්තමානය දක්වා පැමිණ ඇත.

**සමාලෝචනය**

මේ අනුව පෙනී යන්නේ අධ්‍යාපන පද්ධතිය තුළ ලේඛන කලාවේ දී වැදගත් අංශයක් ලෙස සැලකෙන පුස්තකාල සේවාව දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන බවයි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ පුස්තකාල භාවිතය ඈත අතීතයේ සිටම විවිධාකාරයෙන් ක්‍රියාත්මකව පැවති අතර අධ්‍යාපන ක්‍රමය ආරම්භයේ දී නොදියුණු ක්‍රමශිල්ප අනුගමය කළ ද වර්තමානය වන විට තාක්ෂණික ක්‍රමෝපායන් පුස්තකාල භාවිතයේ දී යොදා ගෙන ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Arora & Kanu, (2008), *University Library System*, Deep & Deep Publications Pvt.ltd, Delhi.

Piyadasa, T.G. (1985), *Libraries in Sri Lnaka origin and history*, Sri satguru publication, India.

Ranasinghe, R.H.I.S. (1997), *The possibilities of sharing among university libraries in Sri Lnaka*, S. Godage and Brothers, Colombo 10

උපමාලිකා, ජී. ඩබ්ලිව්. ජී. (2009), ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනය සහ රැකියා අවස්ථා, සමාජ විද්‍යාපති උපාධිය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

කාරියවසම්, යූ. ජී. පී. සහ කාරියවසම් සුන්දරී, (1964), අධ්‍යාපනය හා එහි පදනම

කුලරත්න, ඩබ්. ජී. (2002), ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යුගයේ අධ්‍යාපනය, සාර ප්‍රකාශන හා මුද්‍රණ, කොට්ටාව.

ගුණපාල, වකුල (2015), අපේ අධ්‍යාපනය එදා අද සහ හෙට, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොලඹ 10.

ජයතිස්ස, එල්. ඒ. (1999), පුස්තකාල කළමනාකරණය, කතෘ ප්‍රකාශනයකි, කැලණිය.

වීරසිංහ, ඩබ්. කේ. එම්. එම්. කේ. (2001), පුස්තකාල ඉතිහාසය, කතෘ ප්‍රකාශනයකි.

සමරකොන්, අබේරත්න (2003), ඉගෙනුමට පුස්තකාල**ය**, සමන්ති පොත් ප්‍රකාශකයෝ, ජා-ඇල.

වීරසිංහ, ඩබ්. කේ. එම්. එම්. කේ. (2001), පුස්තකාල ඉතිහාසය, කතෘ ප්‍රකාශනයකි.